| ඉඩම අත්පත්කර ගැනීම | 200 0 | — | — | — | 200 0 | — | — |
| **වෙනත් ගෙවීම** | | | | | | | |
| 1. උත්සව අත්තිකාරම් | 900 0 | — | — | — | — | — | 900 0 |
| 2. ආපද අත්තිකාරම් | 500 0 | — | — | — | — | — | 500 0 |
| 3. නිවාස හා දේපොල | 1,500 0 | — | — | — | — | — | 1,500 0 |
| **කැනපත් ආපසුගෙවීම** | | | | | | | |
| අ. ටෙන්ඩර් | 2,500 0 | 2,500 0 | — | — | — | — | — |
| ආ. වෙනත් : පුස්තකාල | 25 0 | 25 0 | — | — | — | — | — |
| **එකතුව** | 32,625 0 | 2,525 0 | — | — | 200 0 | 27,000 0 | 2,900 0 |
| **එකතුව පුනරාවර්තන හා ප්‍රාග්ධන** | 75,623 85 | — | — | — | — | — | — |
| **වර්ෂය අවසානයට බලාපොරොත්තු අධිකය** | 5,900 77 | — | — | — | — | — | — |
| **එකතුව** | 81,524 62 | — | — | — | — | — | — |

1974.11.26 දින පවත්වන ලද රැස්වීමේ යෝජනා අංක 8 අනුව සම්මත විය.

පක්ෂව ඡන්දය දුන් නියෝජිත මහතුන්ගේ අත්සන් :—

1. ආර්. ආර්. පුංචිරාල
2. කේ. ඇම්. ගුණතිලක
3. ඩබ්. ඇම්. කිරිබණ්ඩා
4. ඇස්. එච්. ඇස්. ද සිල්වා
5. ජේ. ඇම්. සුදුබණ්ඩා
6. ඩබ්. ඇම්. කරුණාරත්න
7. ඩබ්. ඇම්. පියදාස

———,
සභාපති, පස්සර ගම්සභාව.

1974.11.22,
පස්සර ගම්සභා කාර්යාලයේදිය.

4–256—75.4.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කන්තලේ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වැනි වගන්ති යටතේ කන්තලේ සුළු නගර සභාව විසින්, 1975 ජනවාරි මස 1 වැනි දින සිට පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු එහි සඳහන් බලපත්‍ර වෙනුවෙන්, ගනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. ප්‍රේමදාස,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලයය,
කන්තලේ, 74.11.18 දින.

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. ශත |
|---|---|
| (1) බත් කඩ, රෙස්ටුරන්ට් සහ තේ හා කෝපි කඩ :— | |
| (අ) බත් කඩයක් පවත්වාගෙන යාම සඳහා | 25 0 |
| (ආ) රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 250 0 |
| (ඇ) තේ කඩයක් පවත්වාගෙන යාම සඳහා :— | |
| (1) වාර්ෂික වටිනාකම රුපියල් 300ට වැඩි | 25 0 |
| (2) වාර්ෂික වටිනාකම රුපියල් 300ට අඩු | 15 0 |

## කන්තලේ සුළු නගර සභාව

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි හා 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පිළියෙල කරන ලදුව, එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත්කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට කන්තලේ සුළු නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් 1974 ඔක්තෝබර් මස 22 දින අංක 9(1) දරණ සභා සම්මුතිය යටතේ කන්තලේ සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

කේ. ජී. ප්‍රේමදාස,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලයය,
කන්තලේ. 1974.11.18 දින.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 නොවැම්බර් මස 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි I වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල 'අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර' යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වන කොටසේ II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

#### I වැනි කොටස

#### අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය කිරීම.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ශණය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 කට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.
මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කල ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මෑෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සවර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මලක් පවත්වාගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
ගිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 කට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොලක් පවත්වාගෙන යෑම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

#### II වැනි කොටස

#### අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වා ගෙන යෑම.
හම් ගබඩා කර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10 කට වැඩි ගණන් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර වර්ග ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගණයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ටිරන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කල භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රසකැවිලි වර්ග නිපදවීම.
ඡපාල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඞ් නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
හුනුගල් හෝ හුනු ගබඩා කර තබා ගැනීම.
පැනි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
සින්නාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.
සම් භාණ්ඩ නිපදවීම සඳහා කර්මාන්තශාලාවක් පවත්වාගෙනයෑම
පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග කෙටීම.
බේකින් පවුඩර් නිපදවීම.
මාජරීන් නිපදවීම.
ඇස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.
පාසල් රට හුනු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම, හෝ ඔප දැමීම.
පාසල් ගල් ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තබා ගැනීම.
ශීත කල මස් හෝ මාළු ගබඩාකර තැබීම.
කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.
මැණික් ගල් කැපීම සහ ඔප දැමීම.
දියහුනු, සුදු හුනු (වයිටින්) හෝ හිරිගල් නිපදවීම.
එන්සාල්, (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

III වන කොටස

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනින් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුනු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම, හෝ හුනුගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හොන්ඩර 3 කට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සර්විස් කිරීමේ හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.
පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල් තාර හෝ බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායුසමනය යන්ත්‍ර, ශීතකරන හෝ අධිශීතකරන (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

වරක්ටර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යෑම.

4–438/2—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

පාලන නිලධාරි කාර්යාලය—උඩසිය පත්තුව ගම්සභාව

1975 වර්ෂයට අක්කර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

ගම්සභා ආඥාපනත යටතේ ලග්ගල උඩසිය පත්තුව ගම්සභාව පාලනය කරන පාලන නිලධාරි විසින් මීට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කෙරෙන බලපත්‍ර සඳහා එකී උපලේඛනයෙහි සඳහන් බලපත්‍ර ගාස්තුව හා අක්කර බදු ගාස්තුව 1975 ජනවාරි 1 වෙනි දින සිට පනවා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ඩී. සුගතදාස,
පාලන නිලධාරි,
ලග්ගල උඩසිය පත්තුව ගම්ප්‍රදේශය.

1974 දෙසැම්බර් මස 19 වෙනි දින,
ලග්ගල උඩසිය පත්තුව පාලන නිලධාරි කාර්යාලයේ දී ය.

උපලේඛනය

පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් හෝ පාවිච්චි කිරීම සහ වගාවක් සඳහා බලය පවරා දෙන බලපත්‍රයකට :—

| බලපත්‍ර විස්තර | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 1. ආහාර ද්‍රව්‍ය වෙළඳ සැළක් පවත්වා ගෙන යෑම සඳහා ... ... ... | 15 | 0 |
| 2. තේ සහ කෝපි කඩයක් පවත්වා ගෙන යෑම සඳහා ... | 10 | 0 |
| 3. දුම්කොළ වේලීමේ උදුනක් පවත්වාගෙන යෑම සඳහා... | 150 | 0 |
| 4. යකඩ තලන ස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා ... | 17 | 50 |
| 5. වී ඇඹරීමේ යන්ත්‍රයක් පවත්වාගෙන යෑම සඳහා ... | 40 | 0 |
| 6. ප්‍රමාණය අක්කර පහකට වැඩි වගාවක් සඳහා සෑම අක්කරයකටම ... ... | 2 | 0 |

4–75—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය.

### යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයය

ගෝඝාතක ආඥාපනත (272 වන අධිකාරය)

ගෝඝාතක ආඥාපනතේ (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නිසි බලධරයාවූද, යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් තැනවූද, නීල් බයස් වන මම, 1975 වර්ෂයේදී පහත සඳහන් උපලේඛනයේ සඳහන් දිනවලදී කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට නගර ප්‍රදේශ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

නීල් බයස්,
(නිසි බලධරයා)
විශේෂ කොමසාරිස්—යටියන්තොට නගරය.

1975 මාර්තු මස 12 දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යලයේදීය.

උපලේඛනය

1975 ජනවාරි 27 පසළොස්වක පෝය දිනය
1975 පෙබරවාරි 25 පසළොස්වක පෝය දිනය.
1975 මාර්තු 26 පසළොස්වක පෝය දිනය.
1975 මාර්තු 28 මහ සිකුරාදා දිනය.
1975 අප්‍රේල් 25 පසළොස්වක පෝය දිනය.
1975 මැයි 22 ජනරජ දිනය.
1975 මැයි 24 පසළොස්වක පෝය දිනය.
1975 මැයි 25 වෙසක් අතිරේක දිනය.
1975 ජූනි 23 පසළොස්වක පෝය දිනය.
1975 ජූලි 22 පසළොස්වක පෝය දිනය.
1975 අගෝස්තු 21 පසළොස්වක පෝය දිනය.
1975 සැප්තැම්බර් 19 පසළොස්වක පෝය දිනය.
1975 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක සමරු දිනය.
1975 ඔක්තෝබර් 4 ලෝක සත්ව දිනය.
1975 ඔක්තෝබර් 19 පසළොස්වක පෝය දිනය.
1975 නොවැම්බර් 18 පසළොස්වක පෝය දිනය.
1975 දෙසැම්බර් 18 පසළොස්වක පෝය දිනය.

4-516—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### කුරුණෑගල මහ නගර සභාව

නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 26(8) වන වගන්තිය යටතේ අලුතින් පාරක් පවරා ගැනීම පිළිබඳ නිවේදනය මහජනයා වෙත දැනුම් දෙනු ලැබේ.

| පාරේ නම | දිග | පළල |
|---|---|---|
| උඩවල්පොල I වැනි පටුමඟ ... | අඩි 450 ... | අඩි 20 යි |
| උඩවල්පොල II වැනි පටුමඟ ... | අඩි 450 ... | අඩි 30 යි |
| උඩවල්පොල III වැනි පටුමඟ ... | අඩි 420 ... | අඩි 30 යි |

4-170—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### එප්පාවල කෝරලේ ගම් ප්‍රදේශය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් ස්ථානයේ 1975 අප්‍රේල් මස 15 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන එප්පාවල කෝරලේ ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

ජේ. ඇම්. ඩී. වී. ඩබ්ලිව්. ඇන්තනි,
පාලන නිලධාරී,
එප්පාවල කෝරලේ ගම් ප්‍රදේශය.

පාලන නිලධාරී කාර්යාලය,
එප්පාවල,
1975 මාර්තු මස 22 වන දින.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. මුත්තලිප්, 26/11, දෙමටගොඩ ප්ලේස්, කොළඹ 9 ... | ... එළ හරක් මස් ... | ... පොදු වෙළඳපල මස් කඩය |

4-169—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### ඇටම්පිටිය ගමසභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ස්ථානයේ 1975 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබෙන බැවින් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන ඇටම්පිටිය ගමසභා ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුගෙන් විරුද්ධත්වයක් තිබේ නම් එසේ විරුද්ධ වන්නේ අසවල් කරුන නිසා යයි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළතදී මා වෙත එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි පරිච්ඡේදය) 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් ස්වභාවය | පිහිටි ස්ථානය |
|---|---|---|
| ඇම්. එච්. ඒ. වාහිඩ්, නො. 10ඒ, ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල ... | හරක් මස් වෙළඳාම ... | ඇටම්පිටිය නුවරඑළිය පාරේ අංක 14 ගොඩනැගිල්ල |

කේ. බී. අබේසිංහ,
ඇටම්පිටිය ගමසභාවේ සභාපති.

ඇටම්පිටිය ගමසභා කාර්යාලය
ඇටම්පිටිය,
1975 මාර්තු මස 24 වන දින දීය.

4-167—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

නාරම්මල සුළු නගර සභාව

ගෝඝාතක ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17(1) දරණ උපවගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වූ නාරම්මල සුළු නගර සභාවේ සභාපති ඇස්. ඇම්. බී. කේ. සුබසිංහ වන මම, යථෝක්ත ආඥාපනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1975 වර්ෂය තුළ මෙම සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම පහත සඳහන් උපලේඛන යෙහි දැක්වෙන දිනවලදී මෙයින් සම්පූර්ණයෙන් තහනම් කරමි.

උපලේඛනය

1975 ජනවාරි 5, 12, 20 සහ 27.
1975 පෙබරවාරි 3, 11, 19 සහ 26.
1975 මාර්තු 5, 13, 21, සහ 27.
1975 අප්‍රේල් 3, 11, 19 සහ 26.
1975 මැයි 3, 11, 18, 22, 24 සහ 25.
1975 ජූනි 2, 10, 16 සහ 23.
1975 ජූලි 1, 9, 16, 23 සහ 31.
1975 අගෝස්තු 7, 14, 22 සහ 30.
1975 සැප්තැම්බර් 6, 12, 20, 26 සහ 28.
1975 ඔක්තෝබර් 5, 12, 20 සහ 28.
1975 නොවැම්බර් 3, 10, 19 සහ 26.
1975 දෙසැම්බර් 3, 10, 18 සහ 25.
1975 වර්ෂයේ ලෝක සත්ව දිනය.

ඇස්. ඇම්. බී. කේ. සුබසිංහ,
සභාපති,
නාරම්මල සුළු නගර සභාව.

1975. 03. 19 දින,
නාරම්මල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

4–145—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිගල්ල ගම් ප්‍රදේශය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව (272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන ප්‍රදේශයේ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින 14ක් ඇතුළත දී මා වෙත ඉදිරිපත් කළ යුතු බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇම්. වයි. මොහමඩ්, හග්ගමු පාර, ගලහිටියාව, කුලියාපිටිය... | කුලියාපිටිය–හෙට්ටිපොල පාරේ කරන්තිප්පල පිහිටි, ඩබලිව්. ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතාට අයිති සේරුගහ මුල ඉඩම ... | එළ හරක් මස් |

ඩී. ඒ. ජී. සමරදිවාකර,
පාලන නිළධාරි, දිගල්ල ගම් ප්‍රදේශය.

1975 මාර්තු මස 18 වැනි දින,
ඇඹව,
කුලියාපිටිය.

4–144—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

කඹුරුපිටිය ගම්සභාව—මාතර දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් වෙළඳාම සඳහා 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ගම්සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ මත යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| එස්. එම්. එච්. සෙයියදු මොහොමමදු මහතා, රසිනා පාර, ගොඩපිටිය, අකුරැස්ස ... | හරක් මස් හා එළු මස් ... | කඹුරුපිටිය නගරයේ මස් කඩය |

ජේ. වෙල්ලප්පිලි,
කඹුරුපිටිය ගම්සභාවේ සභාපති.

1975 මාර්තු 27 වැනි දින,
කඹුරුපිටිය ගම්සභා කාර්යාලයේ දිය.

4–146—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන අය ඔහුගේ නම් ඉදිරියේ ඇති ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, එසේ බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කරමින් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරයේ) 7 (2) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරන්නාගේ නම | මරණ ස්ථානය | විකුණන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| අයි. ඇම්. පාරිරුස්, 3/1, පැණිතුඩුමුල්ල, නාවලපිටිය... | ගම්සභා මස් වෙළඳ සැල අසල, කඩියන්ලෙන... | ගම්සභා මස් වෙළඳ සැල, කඩියන්ලෙන... | ගරක් මස් |

ඇස්. මාරසිංහ,
සභාපති,
පස්බාගේ කෝරළේ ගම්සභාව,

1975 මාර්තු මස 27 වැනි දින,
ගම්සභා කාර්යාලය,
රඹුක්පිටිය.

4–149—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## නුවරඑළිය මහ නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම සඳහන් අය ඊට ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂය තුළ එළ හරක් මස් හා එළු මස් වෙළදාම් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම් පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වන පරිච්ඡේදය) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන නුවරඑළිය නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුක්තව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දාහතරක් (14)ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

උපලේඛනය

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඉබ්‍රාහිම්, අංක 31/9, ලෝසන් වීදිය, නුවරඑළිය | ...එළු මස් ... | නුවරඑළිය පොදු වෙළඳ පොළේ අංක 9 දරණ එළු මස් කඩ කාමරය |
| 2. | ඇම්. ඇස්. ඒ. ජබාර්, අංක 2, අලුත්කඩ වීදිය, නුවරඑළිය | ...එළ හරක් මස් ... | නුවරඑළිය පොදු වෙළඳ පොළේ අංක 16 දරණ හරක් මස් කඩ කාමරය |

ටී. විලියම් ප්‍රනාන්දු,
නගරාධිපති,
නුවරඑළිය මහ නගර සභාව.

1975 මාර්තු මස 25 වෙනි දින,
නුවරඑළිය මහ නගර සභා කායර්‍ාලයේ දිය.

4–150—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

## පමුණුගම පරිපාලන කාශසිලය

### පමුණුගම

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 17(1) දරණ වගන්තියෙන් පැවරී තිබෙන බලය ප්‍රකාර, නියමිත අධිකාරි තැනවූ පමුණුගම නගරයේ පරිපාලන නිලධාරිතුමා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනයන්හිදී පමුණුගම නගර සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සම්පූර්ණයෙන් තහනම් කරනු ලැබේ.

උපලේඛනය

1975 ජනවාරි 27 දුරුතු මස පුර පසළොස්වක් පෝය දිනය
1975 පෙබරවාරි 25 නවම් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 මාර්තු 26 මැදින් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 මාර්තු 28 මහා සිකුරාද දිනය
1975 අප්‍රේල් 14 සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය
1975 අප්‍රේල් 25 බක් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 මැයි 22 ජනරජ දිනය
1975 මැයි 24 වෙසක් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 මැයි 25 වෙසක් මස පුර පසළොස්වක් පෝය දිනට පසු දිනය
1975 ජූනි 23 පොසොන් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 ජූලි 22 ඇසළ මස පුර පසළොස්වක් පෝය දිනය
1975 අගෝස්තු 21 නිකිනි මස පුර පසළොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 19 බිනර මස පුර පසළොස්වක් පෝය දිනය
1975 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක අනුස්මරණ දිනය
1975 ඔක්තෝබර් 04 ලෝක සත්ව දිනය
1975 ඔක්තෝබර් 19 වප් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 නොවැම්බර් 18 ඉල් මස පුර පසළොස්වක් පෝය දිනය
1975 දෙසැම්බර් 18 උදුවප් මස පුර පසළොස්වක් පෝය දිනය.

ඊ. ඩී. ඩී. පෙරේරා,
පරිපාලන නිලධාරි තැන
පමුණුගම ගම් ප්‍රදේශය.

1975 ජනවාරි මස 21 වන දින,
පමුණුගම පරිපාලන නිලධාරි කාර්යාලයේ දී ය.

4–142—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

## මොරටුව නගරය

### 1975 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තියේ (252 වැනි අධිකාරය) මහ නගර සභා ආඥාපනතේ 235(1) දරණ වගන්තිය සමග කියැවෙන පරිදි 1975 වර්ෂය සඳහා මොරටුව නගරයේ වරිපනම් බදු ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන නියමිත කාර්යාල වේලාවන් තුළ දී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩග්ලස් එෆ්. ගුණවර්ධන,
විශේෂ කොමසාරිස්,
මොරටුව නගරය.

1975 මාර්තු මස 27 වැනි දින,
මොරටුව නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

4–172—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1975 මාර්තු මස 21 වන දින අංක 14 දරණ තීරණය

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි සහ 163 වැනි වගන්ති යටතේ ගලේවෙල සුළු නගර සභාවේ පාලන නිලධාරි විසින් මෙහි උපලේඛනයේ විස්තර කරනු ලබන ලද බලපත්‍ර වෙනුවෙන් එහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු 1975 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවා අය කළයුතු බවට ගලේවෙල සුළු නගර සභාවේ පාලන නිලධාරි වන මම තීරණය කරමි. එමෙන්ම මෙම බලපත්‍ර ගාස්තු නැවත සංශෝධනය කරනතුරු බලපැවැත්විය යුතු බව මෙම ප්‍රකාශයෙන් දැනුම්දීමටද තීරණය කරමි.

| | බලපත්‍රයේ ස්වභාවය | | | වාර්ෂික ගාස්තු ප්‍රමාණය රු. ශ. |
|---|---|---|---|---|
| 1. | පැට්‍රෝල් බෙද හැරීම | ... | ... | 250 0 |
| 2. | ඩීසල් බෙදහැරීම ... | ... | ... | 200 0 |

ආනන්ද ජයසිංහ,
පාලන නිලධාරි,
ගලේවෙල සුළු නගර සභාව.

1975 මාර්තු මස 02 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කායර්‍ාලයේ දී.

4–273—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

## උඩුනුවර ගඟපළාත උතුර ගම්සභාව

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟ පළාත උතුර ගම්සභාව විසින් 1975 වර්ෂය තුළදී පහත සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු ආදිය, උඩුනුවර ගඟපළාත උතුර ගම්සභා ප්‍රදේශය තුළ පනවා අය කිරීමට 1974ක් වූ නොවැම්බර් මස 27 දින පෙරවරු 9.30 ට, ගෙළිඔය කොස්සින්නේ පිහිටි, උඩුනුවර ගඟපළාත උතුර ගම්සභා කාර්යාලයේදී පැවැත්වුන මාසික සභා රැස්වීමේ දී සාකච්ඡා කොට සම්මත කරගත් බව, 257 වැනි අධිකාරය වූ ගම්සභා ආඥාපනතේ 52 වැනි වගන්තිය. යටතේ (1961 අංක 60 දරණ පනතින් සංශෝධිත) සම්පාදිත නියෝග මාලාවේ iv වැනි කාණ්ඩයේ 8 (1) වැනි නියෝග ප්‍රකාර ප්‍රදේශ වාසීන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. වරිපනම් බදු හා අක්කර බදු ඒ ඒ කාර්තුවේදී ගෙවිය යුතු අතර, රථවාහන හා සත්ව බද්ද හා සියළුම වෙළඳ බලපත්‍ර ගාස්තු 1975.03.31 දිනට ප්‍රථම ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

(1) තක්සේරු බද්ද (වරිපනම් බද්ද) දියුණු ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිලි හා සියලුම දේපලවලින් වාර්ෂික වටිනාකමින් 6% ක වරිපනම් බද්ද.

(2) අක්කර බද්ද: අක්කර 5ක් හෝ ඊට වැඩි ඉඩම්වලින් අක්කරයකට රුපියල් 2 බැගින් වූ අක්කර බද්ද.

(3) රථවාහන හා සත්ව බද්ද :

| | රු. | ශ. |
|---|---|---|
| (1) කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහනයකට ... | 5 | 0 |
| (2) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බැඳි කරත්තයකට හෝ තිරික්කලයකට ... | 4 | 0 |
| (3) සැම තනි ගොනා බඳින බරබාග කරත්තයකට හෝ තිරික්කලයකට හෝ අත් කරත්තයකට ... | 2 | 50 |
| (4) සැම ජින් රික්ෂෝ රථයකට ... | 2 | 50 |
| (5) සැම බයිසිකලයකටම ... | 1 | 0 |
| (6) සැම ඇතෙකුට හෝ අලියෙකුට ... | 10 | 0 |

(4) කැලිකසල බද්ද: දියුණු ප්‍රදේශයට අයත්, කැලි කසල ඉවත් කිරීම කරනු ලබන ප්‍රදේශයේ පිහිටි සැම ගොඩනැගිල්ල කින්ම හා සැම දේපලකින්ම මසකට ... 0 50

(5) වෙළඳ බලපත්‍ර ගාස්තු :

| බලපත්‍රයේ ස්වභාවය | බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| (1) බේකරියක් පවත්වාගෙන යාම : | | |
| දියුණු ප්‍රදේශයකවූ කල ... | 35 | 0 |
| නොදියුණු ප්‍රදේශයක වූ කල ... | 25 | 0 |
| (2) බත් කඩයක් පවත්වාගෙන යාම : | | |
| දියුණු ප්‍රදේශයක වූ කළ ... | 25 | 0 |
| නොදියුණු ප්‍රදේශයක වූ කළ ... | 15 | 0 |
| (3) තේ කඩයක් පවත්වා ගෙන යාම : | | |
| දියුණු ප්‍රදේශයක වූ කළ ... | 10 | 0 |
| නොදියුණු ප්‍රදේශයක වූ කළ ... | 7 | 50 |
| (4) සිල්ලර කඩයක් පවත්වාගෙන යාම : | | |
| දියුණු ප්‍රදේශයක වූ කළ ... | 10 | 0 |
| නොදියුණු ප්‍රදේශයක වූ කළ ... | 7 | 50 |
| (5) බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම : | | |
| දියුණු ප්‍රදේශයක වූ කළ ... | 15 | 0 |
| නොදියුණු ප්‍රදේශයක වූ කළ ... | 10 | 0 |
| (6) බීඩි සෑදීම (බීඩි එතීම) සඳහා ... | 20 | 0 |
| (7) රෙස්ටුරන්ට් ශාලාවක් තබා ගැනීම ... | 50 | 0 |
| (8) කිරි පට්ටියක් තබා ගැනීම : | | |
| දෙනුන් 5කට අඩුවූ කළ ... | 10 | 0 |
| දෙනුන් 5හේ සිට 10 දක්වා ... | 25 | 0 |
| දෙනුන් 10කට වැඩිවූ විට ... | 50 | 0 |
| (9) කෘත්‍රිම පොහොර හෝ පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා ... | 25 | 0 |
| (10) තේ කර්මාන්ත ශාලාවකට ... | 250 | 0 |
| (11) හාල් හෝ මිරිස් මෝලක් තබා ගැනීම ... | 20 | 0 |
| (12) ගඩොල් හෝ උළු පිලිස්සීම ... | 35 | 0 |
| (13) හුණු ගබඩා කිරීම ... | 10 | 0 |
| (14) හුණු පෝරණුවක් තබා ගැනීම ... | 35 | 0 |
| (15) ගෘහභාණ්ඩ සෑදීම හා විකිණීම ... | 15 | 0 |
| (16) මුද්‍රණාලයක් තබා ගැනීම ... | 100 | 0 |
| (17) සබන් සෑදීම සඳහා ... | 25 | 0 |
| (18) පපඩම් සෑදීම ... | 25 | 0 |
| (19) එළවලු හෝ පළතුරු කඩයක් තබා ගැනීම ... | 5 | 0 |
| (20) මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් තබා ගැනීම ... | 50 | 0 |
| (21) රස කැවිලි සෑදීම ... | 25 | 0 |
| (22) ලී මඩුවක් තබා ගැනීම ... | 50 | 0 |
| (23) කම්මලක් තබාගැනීම ... | 5 | 0 |
| (24) පැට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් ගබඩා කිරීම ... | 50 | 0 |
| (25) දර මඩුවක් තබා ගැනීම ... | 15 | 0 |
| (26) පෙට්ටි මඩුවක් (තේ පෙට්ටි හෝ වෙනත්) තබා ගැනීම ... | 25 | 0 |
| (27) කුකුල් ගාලක් තබා ගැනීම : | | |
| 50 සිට 100 දක්වා ... | 15 | 0 |
| 101 සිට 200 දක්වා ... | 35 | 0 |
| 201 සිට 500 දක්වා ... | 50 | 0 |
| 500 සිට ඉහළට ... | 100 | 0 |
| (28) ඌරන්, එළුවන් හෝ විකිණිය හැකි වෙනත් සතුන් ඇති කිරීම : | | |
| සතුන් 5 සිට 10 දක්වා ... | 25 | 0 |
| සතුන් 11 සිට 25 දක්වා ... | 50 | 0 |
| සතුන් 25 සිට ඉහළට ... | 100 | 0 |
| (29) කබොක්, බොරලු හෝ කලුගල් කැඩීම : | | |
| යන්ත්‍රානුසාරයෙන් වූ කළ ... | 100 | 0 |
| යන්ත්‍රානුසාරයෙන් නොවූ විට ... | 75 | 0 |
| (30) මාලු විකිණීම ... | 25 | 0 |
| (31) ජාඩි හෝ කරවල ගබඩා කිරීම ... | 25 | 0 |
| (32) ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම ... | 35 | 0 |
| (33) ලී ඉරන ස්ථානයක් තබාගැනීම : | | |
| යන්ත්‍රානුසාරයෙන් වූ කළ ... | 100 | 0 |
| එසේ නොමැතිව ... | 25 | 0 |
| (34) ලොන්ඩරියක් තබා ගැනීම ... | 20 | 0 |
| (35) හොන්ඩරයකට වඩා තේ කුඩු ගබඩා කිරීම ... | 35 | 0 |
| (36) හම් පදම් කිරීම හෝ සපත්තු නිපදවීම හෝ අළුත් වැඩියා කිරීම ... | 35 | [illegible] |
| (37) සිමෙන්ති හොන්ඩර 50 වඩා ගබඩා කිරීම (විකිණීම සඳහා) ... | 20 | 0 |

ඩී. ජේ. විමලරත්න,
උඩුනුවර ගඟපළාත උතුර ගම්සභාවේ සභාපති තැන.

උඩුනුවර ගඟපළාත උතුර ගම්සභාව,
කොස්සින්න, ගෙලිඔය,
1974 දෙසැම්බර් මස 20 වැනි දින.

4–193—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

## ජාඇල නගරය

### ජල භීතිකා රෝගය

ජාඇල නගර සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬුවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නා වූ යම්කිසි සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (ලංකා ව්‍යවස්ථා පිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වන වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළවන දින සිට මාස හයක (6) කාලයක් බලපවත්වනවා ඇත.

කේ. ආරියරත්න සිල්වා,
විශේෂ කොමසාරිස්,
ජාඇල නගරය.

1975 මාර්තු මස 25 වන දින,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

4–173—75. 04. 11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබොඩ පේරුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දැක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන ඔයබොඩ පේරුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙකු වේ නම්, තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළයුතු බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වී වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. කේ. ඇම්. ගනිපා, තිහාරිය, කලගෙඩිහේන | උඩතුත්තිරිපිටිය තෙල්ලිගහමුල මන්සංධියේ, එළහරක් මස් වෙළඳාම. |

ඩී. ඊ. විජයසුන්දර,
ඔයබොඩ පේරුව ගම් සභාවේ සභාපති.

ඔයබොඩ පේරුව ගම්සභාව,
කලොටුවාව, කලගෙඩිහේන,
1975 අප්‍රේල් මස 01 දින.

4-207—75. 04. 11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛණය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 11.04.75 | සිකුරාද | 04.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.04.75 | සිකුරාද | 11.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 18.04.75 | සිකුරාද | දවල් | 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 09.05.75 | සිකුරාද | 02.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 16.05.75 | සිකුරාද | 09.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 23.05.75 | සිකුරාද | 16.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 30.05.75 | සිකුරාද | 23.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 30.05.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 13.06.75 | සිකුරාද | 06.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 20.06.75 | සිකුරාද | 13.06.75 | සිකුරාද | දවල් | 12.00 |
| | 27.06.75 | සිකුරාද | 20.06.75 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී